# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,264 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2022.01.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 64 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 71 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 74 |

***සැ. යු.***- ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 පෙබරවාරි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජනවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - දෙහිඅත්තකණ්ඩිය**

දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද පස් හා භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ පස් හා භාණ්ඩ 2022.02.07 වැනි දින පෙ. ව. 9.00 සිට දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට මත්තෙන් නියමිත පස් හා භාණ්ඩ පරීක්ෂා කර බැලීමට මහජනයාට ඉඩදෙනු ලැබේ.

3. අධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි, එම පස් හා භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

4. වෙන්දේසියේ පස් හා භාණ්ඩ මිලදී ගන්නා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්‍යය වේ.

5. පස් හා භාණ්ඩ මිලදී ගැනීම ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මගින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

6. මිලදී ගන්නා ලද පස් ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් සිදු කරනු නොලැබේ. ඒ සඳහා බලපත්‍රය පස් මිලදී ගන්නා අය විසින් සකස් කර ගත යුතු ය.

7. මිලදී ගන්නා පස් හා භාණ්ඩ එදින ප. ව. 4.00ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ඩබ්. එම්. එම්. අයි. වාසල,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
දෙහිඅත්තකණ්ඩිය.

2022 ජනවාරි මස 11 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු.* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය අංකය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | අංක රහිත | ඔරු | 18 |
| 02. | අංක රහිත | කොල්ලෑ | 13 |
| 03. | අංක රහිත | පාපැදි | 29 |
| 04. | අංක රහිත | බැරල් (විශාල) | 13 |
| 05. | අංක රහිත | බැරල් (මධ්‍යම) | 08 |
| 06. | අංක රහිත | බැරල් (කුඩා) | 17 |
| 07. | අංක රහිත | පස් | කියුබ් 03 |

01-162

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - නුවරඑළිය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද, හිමිකම් නොපෑ භාණ්ඩ සහ 2019 සහ 2020 භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් වන නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද, හිමිකම් නොපෑ භාණ්ඩ සහ 2019 සහ 2020 භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ 2022.02.12 වැනි දින පෙ. ව. 10.30 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත භාණ්ඩවලට හිමිකම් පාන්නෙකු වේනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. චෙක්පත් ආදිය භාර ගනු නොලබන අතර සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු ය.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා ගැනුම් කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු අනන්‍යතා පත්‍රයක් අනිවාර්යෙන් ඉදිරිපත් කළ යුතු ය.

ජී. ජී. පී. ජයසිංහ,
*වැඩ බලන මහෙස්ත්‍රාත්/අතිරේක දිසාවිනිසුරු,*
මහෙස්ත්‍රාත් අධිකරණය
නුවරඑළිය.

2022 ජනවාරි 11 වැනි දින,
නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

2022.02.12 වැනි දින වෙන්දේසියට නියම කර ඇති භාණ්ඩ ලේඛනය

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ ලේඛනය* |
|---|---|---|
| 01 | 94872 | කලයක් සහ බාස්කට් 03ක් |
| 02 | 94876 | LITRO 12.5Kg ගෑස් සිලින්ඩර් 01, ප්‍රෙෂර් කුකර් 01 |
| 03 | 95947 | කලු පාට ප්ලාස්ටික් බාල්දි 02 |
| 04 | 90100 | පොරවක් |
| 05 | 96329 | උදැල්ලක් |
| 06 | 84580 | ඇල්කතීන් බට |
| 07 | 94808 | ප්‍රෙෂර් කුකර් 01, කහ පැහැති ප්ලාස්ටික් කෑන් 01 |
| 08 | 93910 | ප්ලාස්ටික් වැලි තාච්චි 02, මුල්ලු 01, අලවංගු 01 |
| 09 | 95801 | LITRO 12.5Kg ගෑස් සිලින්ඩර් 01, තනි ලිප සහිත ගෑස් ලිප සහ රෙගියුලේටරය සහිත තැඹිලි පාට ගෑස් බටය, ප්‍රෙෂර් කුකර් 01 |
| 10 | 94759 | ලොකු මුට්ටි 01 |
| 11 | අංක රහිත | අංක රහිත ගෙවී ගිය ටයර් 04 |
| 12 | 2019/20 භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන් කරන ලද භාණ්ඩ | විධායක පුටු 01, ජල ටැංකි 01, දින මුද්‍රා 01, යතුරු ලියන පුටු 06/ ෆයිල් ට්‍රේ 05/ යතුරු ලියන මේස 01/ ලිපි බඳුන් ආවරණ සහිත 01/ ටීපෝ 01 |
| 13 | අංක රහිත | මේසය සහිත මහන මැෂින් 01/ මහන මැෂිම රහිත මේස 01/ මේසය රහිත මහන මැෂින් 01 |
| 14 | 62181 | 227-3484 දරන Mazda Bongo වර්ගයේ ඩීසල් ලොරි රථය |
| 15 | අංක රහිත | රිම් එක සහිත කුඩා ටයර් 01 |

**මහෙස්ත්‍රාත් අධිකරණය - සියඹලාණ්ඩුව**

ප්‍රසිද්ධ භාණ්ඩ (වැලි) වෙන්දේසිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ පහත උපලේඛනයේ සඳහන් වැලි 2022.02.11 වැනි දින පෙ. ව. 10.00ට සියඹලාණ්ඩුව මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය (වැලි) මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

02. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ (වැලි) වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

03. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ (වැලි) සඳහා එවෙලෙහිම මුදල් ගෙවිය යුතු අතර, වැලි සතියක කාලයක් තුළ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලු ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

04. ගැණුම්කරුවන් විසින් මිලදී ගනු ලබන වැලි අධිකරණයෙන් පිටතට ප්‍රවාහනය කිරීම සඳහා ගතයුතු නෛතික ක්‍රියාමාර්ග තමන් විසින් ගත යුතු ය.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

06. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිරීමක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ද දැන්විය යුතු ය. ඊට පසුව ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

07. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

ඩී. එම්. රවීන්ද්‍ර රන්ජන් බණ්ඩාර,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
සියඹලාණ්ඩුව.

2022 ජනවාරි 05 වැනි දින,
සියඹලාණ්ඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | විවිධ නඩුකරයන්ට අදාළව | වැලි තොගයක් |

01 - 190

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හලාවත**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ
වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණයේ බී. 1236/19 නඩුවට අදාළ තවදුරටත් රඳවා තබා ගැනීමට නොහැකි ටෝලර් යාත්‍රාව සහ ඊට අදාළ පහත සඳහන් භාණ්ඩ, අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ, මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ හා අධිකරණ අලුත් වැඩියාවෙන් ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය වර්ෂ 2022.02.07 වැනි දින ප. ව. 12.30 ට මෙම අධිකරණ භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් භාණ්ඩයක් හෝ භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් කියන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙර හෝ වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ලිඛිතව අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව ඇත.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන යම් භාණ්ඩයක් වේ නම් එම අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම් ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසිය පවත්වන වේලාවේදීම එය ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

බී. ඒ. ඒ. අයි. බුද්ධදාස,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
හලාවත.

2022 ජනවාරි 12 වැනි දින,
හලාවත දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01 | බී.1236/19 | අංක I-MUL-A-0244-GLE දරන ටෝලර් යාත්‍රාව<br>අංක DEH-4550-UB දරන කැසට් යන්ත්‍ර 01<br>HUNO-32. Model Number<br>4436 - 0781 දරන GPS යන්ත්‍ර 01<br>ලොකු බැටරි කැලි 02<br>AA ප්‍රමාණයේ බැටරි කැලි 03<br>02 kg කාබන්ඩයොක්සයිඩ් සිලින්ඩරය<br>LED වර්ගයේ විදුලි ලාම්පු 02,<br>I-COM-AT-130 වර්ගයේ ඇන්ටනා ටියුනර් 01<br>I-COM-IC-M710 වර්ගයේ රේඩියෝ යන්ත්‍රය හා එම යන්ත්‍රයේ රිසිවර් 01<br>MAGNETIC COMPASS 01<br>LUCAS වර්ගයේ බැටරි 03<br>PANASONIC වර්ගයේ බැටරි 01<br>දැල් ආම්පන්න<br>මෝර දැල් කට්ටල 01<br>මසුන් මැරීමට යොදා ගන්නා පන්නාකටු 200ක් (දිරාපත් වී ඇත) |
| 02 | බී.1236/19 | ඩීසල් ලීටර් 1130 |
| 03 | 34716/21 | වැලි කියුබ් 01 |
| 04 | 34717/21 | වැලි කියුබ් 01 |
| 05 | 34796/21 | වැලි කියුබ් 01 |
| 06 | 34797/21 | වැලි කියුබ් 01 |
| 07 | 34877/22 | වැලි කියුබ් 01 |
| 08 | 34934/22 | වැලි කියුබ් 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 09 | 35075/22 | වැලි කියුබ් 01 |
| 10 | 35229/22 | වැලි කියුබ් 03 |
| 11 | 31521/21 | බොරලු කියුබ් 02 |
| 12 | | ප්ලාස්ටික් බෝතල් තොගයක් |
| 13 | | වීදුරු බෝතල් තොගයක් |
| 14 | | ප්ලාස්ටික් බූලි තොගයක් |
| 15 | | ප්ලාස්ටික් බැරල් තොගයක් |
| 16 | | යකඩ බැරල් තොගයක් |
| 17 | | පොල් තොගයක් |
| 18 | | අධිකරණ අලුත්වැඩියාවෙන් ඉවත් කරන ලද ද්‍රව කොටස් |

01 - 199

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කැබිතිගොල්ලෑව**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොපාන ලද, නඩු අංක මැකී ඇති, නඩු වාර්තා සොයා ගැනීමට අපහසු පහත සඳහන් භාණ්ඩ 2022.02.12 වැනි දින පෙ. ව. 10.00 ට කැබිතිගොල්ලෑව දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවේලේම මුදල් ගෙවා ප. ව. 03.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාර ගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන්වීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාර ගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියළුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

එච්. කේ. මාලින්ද හර්ෂණ ද අල්විස්,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
කැබිතිගොල්ලෑව.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,
කැබිතිගොල්ලෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**කැබිතිගොල්ලෑව මහෙස්ත්‍රාත් අධිකරණයේ 2022.02.12 වැනි දින පවත්වන ප්‍රසිද්ධ වෙන්දේසියේ නඩු භාණ්ඩ ලැයිස්තුව**

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ ලේඛනය* |
|---|---|---|
| 01 | 4267 | ඇළුමිණියම් මුට්ටි 01යි<br>ඇළුමිණියම් කොරහ එකයි |
| 02 | 2136 | ඇළුමිණියම් මුට්ටි 01 යි |
| 03 | අංක රහිත | කැති 150 යි. |
| 04 | අංක රහිත | පොරෝ 46 යි. |
| 05 | අංක රහිත | උදළු 51 යි. |
| 06 | අංක රහිත | සවල් 82 යි. |
| 07 | අංක රහිත | බූලි 61 යි. |
| 08 | අංක රහිත | ඇළුමිණියම් කළගෙඩි 20 යි. |
| 09 | අංක රහිත | ප්ලාස්ටික් කළගෙඩි 03 යි. |
| 10 | අංක රහිත | ලොකු ඇළුමිණියම් කිරි කෑන් 01 යි. |
| 11 | අංක රහිත | වීදුරු බෝතල් 800 යි. |
| 12 | අංක රහිත | TOYOTA Belta මෝටර් රථයෙන් භාවිතයෙන් ඉවත් කරන ලද<br>• ඉදිරිපස සහ පිටුපස Shockup Shober 04 යි.<br>• ඉදිරිපස සහ පිටුපස Bark pad<br>• Rubber Bush 02 යි. |
| 13 | අංක රහිත | රබර් බට 10 කි. ග්‍රෑ. |
| 14 | අංක රහිත | වානේ අල්මාරි 02 |
| 15 | අංක රහිත | ඇඳි බංකු 02 |
| 16 | අංක රහිත | වානේ කබඩ් (ලාච්චු 04) 02 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ ලේඛනය |
|---|---|---|
| 17 | අංක රහිත | සිවිලිං විදුලි පංකා 13 |
| 18 | අංක රහිත | පුටු ලී ඇඳි සහිත 26 |
| 19 | අංක රහිත | පුටු ලී ඇඳි රහිත 10 |
| 20 | අංක රහිත | පුටු කුෂන් කැරකෙන 01 |
| 21 | අංක රහිත | ෆැක්ස් යන්ත්‍ර 01 |
| 22 | අංක රහිත | පරිගණක යන්ත්‍ර - (CPU) 03<br>(Serial No. - PBO3AG2Y PC00P9QM<br>Asset code - 6112201-21-126 |
| 23 | අංක රහිත | පරිගණක මුද්‍රණ යන්ත්‍ර 01<br>(Serial No. - E71077K5N268185) |
| 24 | අංක රහිත | පරිගණක මොනිටර් 05<br>(Serial No. - 625594-001<br>60BDAAR6WW4902FNEL<br>01WK23-74261-OAT-09KU<br>LN414104 PF<br>60BDAAR6NPV900H913 |
| 25 | අංක රහිත | පරිගණක බැටරි (UPS) 03<br>(Serial No. - 241305345165<br>518501171404786<br>518501171404787 |
| 26 | අංක රහිත | ඡායා පිටපත් යන්ත්‍ර 01<br>Toshiba-e-studio-232/6112201-22-9)<br>ඡායා පිටපත් යන්ත්‍ර 01<br>(Konica Minolta/6112201-22-10) |
| 27 | අංක රහිත | ස්ටූල් - සේප්පු 01 |
| 28 | අංක රහිත | මේස ලී - පරිගණක 01 |
| 29 | අංක රහිත | මේස ලී - වෙනත් 01 |
| 30 | අංක රහිත | වතුර ටැංකි - ප්ලාස්ටික් 01 |
| 31 | අංක රහිත | වායු සමන යන්ත්‍ර 01 |
| 32 | 635 | ගෑස් සිලින්ඩර් එකයි. (12.5l)<br>රෙගියුලේටරය සහිත බටය සවිකර ඇති යකඩ රාමුව සහිත ගෑස් ලිප් එකයි.<br>හිස් බූලි 01 යි. |
| 33 | 4172 | ගෑස් සිලින්ඩර් එකයි (12.5l)<br>ලිප් දෙකේ ගෑස් ලිප් එකයි<br>හිස් බූලි 01 යි. |

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ ලේඛනය* |
|---|---|---|
| 34 | අංක රහිත | බොරළු කියුබ් 40.5 යි. |
| 35 | අංක රහිත | උළු කැට 3000 |
| 36 | 86775 | සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටර් එන්ජිම |
| 37 | 85949 (බී 441/17) | NCGP - 4091 දරන ටොයොටා වර්ගයේ ලොරි රථය |
| 38 | 96066 (බී 778/19) | CPLB - 9810 දරන ටොයොටා වර්ගයේ ලොරි රථය |
| 39 | 97277 | NCTM - 2929 දරන යතුරු පැදිය |

01 - 257

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 140, වෙදගෙදර, ඉහළ ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ ලිපිනයේ පදිංචි පඩුවාවල කංකානමලාගේ විකුම් සර්ධාවර්ධන 630030595V වන මා, ප්‍රසිද්ධ නොතාරිස් නීතිඥ කේ. එස්. විජේසේකර වර්ෂ 2013.05.22 වැනි දින ලියා සහතික කළ අංක 1274 දරන ඇටෝර්නි බලපත්‍රය මගින්, මාගේ ඇටෝර්නි බලකරු ලෙස ඉඹුල්ගොඩ, ඉහළ ඉඹුල්ගොඩ, වෙදගෙදර අංක 140 ලිපිනයේ පදිංචි පඩුවාවල කංකානමලනාගේ අතුල සර්ධාවර්ධන යන අය පත්කිරීම වර්ෂ 2021.12.21 වැනි දින සිට මෙයින් නීත්‍යානුකූලව අවලංගු කර අහෝසි කරන බවටත්, මින් මතුවට එකී ඇටෝර්නි බලපත්‍රයේ කිසිඳු නීත්‍යානුකූල පිළිගැනීමක් හෝ වලංගුභාවයක් නොමැති බවටත් එයට කිසිදු වගකීමක් නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයටත්, එකී ජනරජයේ මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

පඩුවාවල කංකානමලාගේ විකුම් සර්ධාවර්ධන

01 - 166

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

සෙනිඩ් බිස්නස් සොලූෂන්ස් ලිමිටඩ් (PB 00245385) 2021 දෙසැම්බර් මස 21 වැනි දින ලැයිස්තුගත සමාගමක් වීමෙන් පසු 2021 දෙසැම්බර් මස 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, 11 (3) වගන්තිය යටතේ එහි නාමය සෙනිඩ් බිස්නස් සොලූෂන්ස් පීඑල්සී වශයෙන් වෙනස් කිරීමට යෝජනා සම්මත කර ගන්නා ලද බව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 11(5) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,

2022 ජනවාරි මස 04 වැනි දින.

01-176

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම

දෙහිවල, නිකපේ පාර, අංක 54/1 හි පදිංචි අබ්දුල් නාZසිර් මුස්තාක් අහ්මඩ් සහ ෂෙයි Zසීනත් ශරීකා සුහයිමින් වන අප 2014 අප්‍රේල් 16 වැනි දින ලියාපදිංචි කළ අංක 209 දරන සහ 2016 සැප්තැම්බර් මස 9 වැනි දින ලියාපදිංචි කළ අංක 324 දරන කොළඹ ජී. එම්. එම්. එල්. එම්. සිද්දීක් නීතිඥ මහතා විසින් ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍ර දෙක මගින් අපගේ ඇටෝර්නි බලකරු වශයෙන් දෙහිවල හිල් වීදියේ අංක 244/3 හි පදිංචි මොහොමඩ් ෆාZසීම් මොහොමඩ් පාZසිල් පත්කළ අතර අද පටන් එම බලතල අවලංගුකර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

අබ්දුල් නාZසිර් මුස්තාක් අහ්මඩ්
ෂෙයි Zසීනත් ශරීකා සුහයිමින්

01 - 177

**2007 අංක 07 දරන සමාගම් පනතේ 244(3) වැනි වගන්තිය ප්‍රකාරව සමාගම් ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ්, අක්බාර් ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ ඒකාබද්ධ කිරීම

සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ් සමාගම (සමාගම් අංක PB 335), අක්බාර් ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (සමාගම් අංක PV 11321) සමඟ ඒකාබද්ධ කරන ලද බව හා 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (1) (අ) වගන්තිය ප්‍රකාරව සමාගම් ඒකාබද්ධ කිරීමේ සහතිකය සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (2) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීම 2021 දෙසැම්බර් මස 30 වැනි දින සිට බලාත්මක වන අතර ඉහත සඳහන් ඒකාබද්ධ කරනු ලබන සමාගම් 2021 දෙසැම්බර් 30 වැනි දින සිට සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ් යන නමින් පවත්වාගෙන යනු ලබයි.

අධ්‍යක්ෂක,

සන්ෂයින් හෙල්ත්කෙයා ලංකා ලිමිටඩ්.

01-178

---

**කැෂ්වැගන් (පුද්ගලික) සමාගම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වැනි වගන්තිය යටතේ දැනුම්දීම

අංක 15/1, ජෝෂෆ් මාවත, කොළඹ 04 හි පිහිටි ෆ්‍රොන්ටියර් ඇඩ්වයිසරි (පුද්ගලික) සමාගමෙ හි සිටින මොහොමඩ් සාහිර් මොහාමඩ් අස්රීන් වන මම 2022 ජනවාරි 11 වැනි දිනැති විශේෂ යෝජනා සම්මතය මගින් කැෂ්වැගන් (පුද්ගලික) සමාගමේ ඇවරකරු ලෙස පත්කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

මොහොමඩ් සාහිර් මොහාමඩ් අස්රීන්

ෆ්‍රොන්ටියර් ඇඩ්වයිසරි (පුද්ගලික) සමාගම,
අංක 15/1, ජෝෂෆ් මාවත,
කොළඹ 04.

01 - 182/1

---

**සී/ස කැෂ්වැගන් (පුද්ගලික) සමාගම**
**(ස්වේච්ඡාවෙන් ඇවර කිරීම)**

2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

2022 ජනවාරි 11 වැනි දින පහත සඳහන් විශේෂ යෝජනාව සමාගමේ සාමාජිකයින් විසින් සම්මත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී/ස කැෂ්වැගන් (පුද්ගලික) සමාගම ස්වේච්ඡාවෙන් ඇවර කිරීම සහ කොළඹ 04, ජෝසප් වීදිය අංක 15/1, D හි ඇති ෆ්‍රොන්ටියර් ඇඩ්වයිසරි (පුද්ගලික) සමාගමේ හි ඇවර කරන්නා ලෙස මොහොමඩ් සහීර් මොහොමඩ් අස්රීන් මහතා පත් කළ බවට මෙයින් දන්වා සිටිමි.

ඩී. එම්. එස්. එස්. සංසදාස,
අධ්‍යක්ෂක,
සී/ස කැෂ්වැගන් (පුද්ගලික) සමාගම.

01 - 182/2

---

**ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ලියාපදිංචි අංකය PV 21075**

2007 අංක 07 දරන සමාගම් පනතේ 346(1) වගන්තිය යටතේ ඇවරකරුගේ පත්වීමේ දැන්වීම

සමාගමේ නම : ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 69/1, හෝකන්දර දකුණ, හෝකන්දර
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ, සිවිල්)
නඩු අංකය : HC(Civil)/58/2019/CO
ඇවරකරුගේ නම : ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්
ලිපිනය : ඇවරකරු, 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04.
පත්වීමේ දිනය : 2020 ජූලි, 13

01-184/1

**ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ලියාපදිංචි අංකය PV 21075**

2007 අංක 07 දරන සමාගම් පනතේ 270(අ)(ඉ) සහ (ඊ) වැනි වගන්තිය යටතේ පරිවෘත කිරීමේ නියෝගය

සමාගමේ නම : ඉෂාරා ඉංජිනියර්ස් ඇන්ඩ් ලොරි බොඩි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 69/1, හෝකන්දර දකුණ, හෝකන්දර
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ, සිවිල්)
නඩු අංකය : HC(Civil)58/2019/CO
නියෝගය දුන් දිනය : 2020 ජූලි 13 වැනි දින
පෙත්සම ඉදිරිපත් කළ දිනය : 2019 ජූලි 26 වැනි දින
ඇවරකරුගේ නම : ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්
ලිපිනය : ඇවරකරු, 3 වන මහල, අංක 11, කාසල් පටුමග

01-184/2

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වැනි වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : සොෆ්ට් සර්ව් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 76664
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 361/7, මහවත්තේ පාර, මිරිහාන, නුගේගොඩ
සමාගමේ නව නාමය : සොෆ්ට්සර්ව් සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2021 දෙසැම්බර් මස 21 වැනි දින

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - සමාගම් ලේකම්වරු

01-186

---

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කැස්බෑව, බණ්ඩාරගම පාර, වලව්වත්ත, අංක 228/11 හි පදිංචි අළුත්ගම බදුගේ චින්තක ජයනන්ද (ජා. හැ. ප. අංක 823452551V) වන මම කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. බෙත්මගේ මහතා විසින් සහතික කරන ලද අංක 4463 සහ 2013 ක් වූ අගෝස්තු මස 06 වැනි දින විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් කැස්බෑව, බණ්ඩාරගම පාර, වලව්වත්ත, අංක 228/ 11 හි පදිංචි ගම්මැද්දේ ගෙදර අතපත්තු හේරත් මුදියන්සේලාගේ නිශාන්ත අනුර බණ්ඩාර හේරත් (ජා. හැ. ප. අංක 722572521V) හට දෙන ලද ඇටෝර්නි බලය 2022.01.06 වැනි දින සිට අවලංගු කරන ලද බවත්, ඔහු විසින් මින් ඉදිරියට කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වගනොකියන බවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුදෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

අළුත්ගම බදුගේ චින්තක ජයනන්ද.

01 - 187

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මාතර, කුමාරතුංග මාවත, අංක 380 ලිපිනය තිබූ බුද්ධි නිශාරා වීරකෝන් NIC868662719V යන අයට මාතර, කුමාරතුංග මාවත, අංක 380 ලිපිනය තිබූ දැනට කැනඩාවේ මැනිටොබා R3T6C7 විනිපෙග් මේෆීල්ඩ්ක්‍රෙයිව් 227 පදිංචි චමින්ද වීරකෝන් NIC753541101V විසින් දෙන ලද රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ගාල්ල කලාප කාර්යාලයේ දින පොත් අංක 766 පත්‍රිරු 82 සහ අංක 112 වෙළුමේ ලියාපදිංචි කැනඩාවේ මැනිටොබා පළාතේ ප්‍රසිද්ධ නොතාරිස් හසක යූ. රත්නමලල විසින් සහතික කරන ලද 2020 පෙබරවාරි 29 දරන සමාන්‍ය ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව ඇටෝර්නි අධිපතිගේ උපදෙස් ප්‍රකාරව නීතීඥ යමුණා පුෂ්පකාන්ති මහගමගේ වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට මහජනතාවටත් මෙයින් දන්වමි. ඇටෝර්නි අධිපති චමින්ද වීරකෝන් වෙනුවෙන් බුද්ධි නිශාරා වීරකෝන් විසින් සිදු කරන්නා වූ කිසිම ක්‍රියාවක් සම්බන්ධව වගකීම චමින්ද වීරකෝන් විසින් භාරගනු නොලබන බව තවදුරටත් මෙයින් දන්වමි.

01-210

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මාතර, කුමාරතුංග මාවත, අංක 380 ලිපිනය තිබූ බුද්ධි නිශාරා වීරකෝන් NIC868662719V යන අයට මාතර, කුමාරතුංග මාවත, අංක 380 ලිපිනය තිබූ දැනට කැනඩාවේ මැනිටොබා R3T4M7 විනිපෙග් ලේක්විලේජ්රෝඩ් 47 පදිංචි සඳුන් වීරකෝන් NIC782942247V විසින් දෙන ලද රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ගාල්ල කලාප කාර්යාලයේ දින පොත් අංක 767 පත්‍රිරු 82 සහ අංක 112 වෙළුමේ ලියාපදිංචි කැනඩාවේ මැනිටොබා පළාතේ ප්‍රසිද්ධ නොතාරිස් හසක යූ. රත්නමලල විසින්

සහතික කරන ලද 2020 පෙබරවාරි 29 දරන සමාන්‍ය ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව ඇටෝර්නි අධිපතිගේ උපදෙස් ප්‍රකාරව නීතිඥ යමුණා පුෂ්පකාන්ති මහගමගේ වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වමි. ඇටෝර්නි අධිපති සඳුන් වීරකෝන් වෙනුවෙන් බුද්ධි නිශාරා වීරකෝන් විසින් සිදු කරන්නා වූ කිසිම ක්‍රියාවක් සම්බන්ධ වගකීම සඳුන් වීරකෝන් විසින් භාරගනු නොලබන බව තවදුරටත් මෙයින් දන්වමි.

01-211

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම මහජනතාව වෙත දන්වා සිටිනු ලබන වග නම් :- මීගමුව, ඒත්තුකාල, පාසැල් පටුමග, අංක 03 හි පදිංචි මාලිමගේ පීටර් එරික් ප්‍රනාන්දු (ජාතික හැඳුනුම්පත් අංකය 603212134V) වන මා විසින් මීගමුව, කටුවපිටිය පාර, අංකඃ 30/1 හි පදිංචි මාලිමගේ ඇන්තනී ලූෂන් ප්‍රනාන්දු ජාතික හැඳුනුම්පත් අංකය 471043770V) වෙත පවරා ඇති වර්ෂ 1990 ක් වූ ජනවාරි මස 24 වැනි දින ඇන්ඩෲ තිසේරා නීතිඥ තැන විසින් සහතික කළ අංක . 649 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත්, මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය මත එකී මාගේ ඇටෝර්ණි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙණුවකට මා වග නොකියන බවත්, මෙයින් දැනුම් දෙමි.

මාලිමගේ පීටර් එරික් ප්‍රනාන්දු.

01-212

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

ගාල්ල දිසා අධිකරණයේ දී ය

සණස ඩිවොලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. නොහොත් සණස සංවර්ධන බැංකුව පී.එල්.සී. යන නාමයෙන්ද, අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06.

........................ පැමිණිලිකරු.

එදිරිව

නඩු අංකය ඃ 3165/එම්. බී.

1. දොන් ජයසිංහ ආරච්චිගේ තුසන්ත දිනූෂ මනෝජිත්
2. කරාගොඩ විදාන ගමගේ බියට්‍රිස් නොහොත් බේබි

දෙදෙනාම අන්දරඔිවිට, යක්කලමුල්ල, ගාල්ල

......................... විත්තිකරුවන්.

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2017 ක්වූ නොවැම්බර් මස 17 දිනැති ගාල්ල දිසා අධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාර විත්තිකරුවන්ගෙන් පැමිණිලිකාර බැංකුවට අයවිය යුතු රුපියල් 1,151,329.52 ක මුදලක් ද, එකී මුදල මත වර්ෂ 2016 ක් වූ අගෝස්තු මස 11 වැනි දින සිට තීන්දු ප්‍රකාශිත දිනය වන 2017 ක්වූ නොවැම්බර් මස 17 වැනි දින තෙක් වර්ෂයකට 17% ක් බැගින් වූ පොළිය රු. 243,450.98 ක මුදලක් ද, ඉන් අනතුරුව නෛතික පොළිය රු. 270,082.22 ක මුදලක් ද, සහ නඩු ගාස්තු රු. 20,500.00ක මුදලක් ද, 2017.11.17 වැනි දිනට පසුව ඉදිරියටත් අයවිය යුතු පොළී මුදල් සහ වෙන්දේසි ගාස්තු ඇතුළු නඩු ගාස්තු පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීම සඳහා විත්තිකරුවන්ට විරුද්ධව ප්‍රකාශ කරන ලද නඩු තීන්දුව ප්‍රකාර ක්‍රියා කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින්, එකී මුදල් පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීම සඳහා මෙම නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අඥාවේ බලය පිට පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති විත්තිකරුවන්ට අයත් නිශ්චල දේපල වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරණු ලැබේ.

දේපලට පිවිසීම ඃ

යක්කලමුල්ල අකුරැස්ස පාරේ අකුරැස්ස දෙසට කි. මී. 8ක් පමණ මාගෙදර හන්දිය දක්වා ගමන් කර මාගෙදර හන්දියෙන් වමට හැරී නීල් ද අල්විස් මාවතේ කි. මී. 1ක් පමණ ගමන් කර දකුණට හැරී බොරළු පාරේ මී. 100ක් පමණ ඉදිරියට යන විට අදාල දේපල හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් 25% ක් දේපල මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) අදාල පළාතේ පාලන ආයතනයට ගෙවිය යුතු ගැණුම් මිලට 1% ක ගාස්තුව

(3) වෙන්දේසිකරුගේ ගාස්තුව ගැණුම් මිලට 2.5%ක්

### උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගෙදර - නැගෙනහිර 182 ඩී ග්‍රාමනිලධාරී වසමේ මාගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. රණසිංහ මහතා විසින් මැන සකස් කළ 1977.10.16 දිනැති අංක 356 දරන පිඹුර ප්‍රකාර වලුගල්ගොඩ හෙවත් ඕකන්දුහේන නම් වූ ඉඩමේ අංක 1137 ඒ දරන කැබැල්ලට මායිම් ව උතුරට : කැබලි අංක 1087 ද, නැගෙනහිරට: කැබලි අංක 64ඊ ද, දකුණට : කැබලි අංක 1137බී ද, බස්නාහිරට මාර්ගය සඳහා වෙන් කළ බිමද යන මායිම් තුළ පිහිටි අක්කර දහයයි පර්චස් දෙක (අ. 10: රූ. 0: පර්.2) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕඩී. 67/1 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. ඩී. යූ. කරුණාරත්න මහතා විසින් මැන සකස් කළ 2011.08.27 දිනැති අංක 111බී/2011 දරන පිඹුර ප්‍රකාර පහත පරිදි විස්තර වේ:-

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගෙදර - නැගෙනහිර 182 ඩී ග්‍රාම නිලධාරී වසමේ මාගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. ඩී. යූ. කරුණාරත්න මහතා විසින් මැන සකස් කළ 2011.08.27 දිනැති අංක 111බී/2011 දරන පිඹුර ප්‍රකාර වලුගල්ගොඩ හෙවත් ඕකන්දහේන නම් වූ ඉඩමේ අංක 1137 ඒ දරන කැබැල්ලට මායිම්, උතුරට : කැබලි අංක 1087 ද (අ.ග.පි. 549) නැගෙනහිරට : කැබලි අංක 64ඊද (අ. ග.පි. 549) දකුණට: කැබලි අංක 1137 බී ද, බස්නාහිරට : කැබලි අංක ඒ (අඩි 20ක් පළල පාර) යන මායිම් තුළ පිහිටි අක්කර දහය (අ. 10: රූ.0 :පර්. 0)ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද වේ.

තවද ඉහත කී අංක 356 සහ 111 බී දරන පිඹුරු වල දක්වා ඇති ඉඩමට ගමන් කිරීම සඳහා පවතින පරවශ්‍යතා අයිතීන් ඇතුළු සියලු පරවශ්‍යතා අයිතීන් ද සමග වේ.

අධිකරණයේ අණ පරිදි,

ජේ. ඩබ්. ඊ. ජයවර්ධන,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

2022 ජනවාරි මස 03 වැනි දින දී ය.

01 - 161

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එච්. ආර්. කේ. ඩබ්ලිව්. කේ. කුමාර සහ එච්. ආර්. කේ. විපුලසේන. ගිණුම් අංක : 0060 5000 9538.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.10.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැත්තෑ දෙලක්ෂ හැත්තෑ තුන් දහස් තුන්සිය දහයයි ශත හැට නවයක (රු. 17,273,310.69) මුදල ද, 2020 සැප්තැම්බර් මස 11 වැනි දින සිට අංක 354 සහ 1575 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි පනස් පන් ලක්ෂයක (රු. 15,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.11.13 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.11.13 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2022.02.15 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්යේ, බුත්තල කෝරළේ, කතරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කඳසුරිඳුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ දෙටගමුව ග්‍රාමයේ පිහිටි ''දෙටගමුවේ හේන '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්නරාජා යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් 31 දතම හා අංක 2015-332 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් **A** වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සහ **EPTP** 25හි ලොට් 679, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : **EPTP** 25හි ලොට් 661, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 2015-332 දරන එකී පිඹුරට අනුව ය.

එකී ලොට් **A** පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී දෙටගමුව ග්‍රාමයේ පිහිටි ''දෙටගමුවේ හේන'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී. අත්තනායක යන අය

විසින් සාදන ලද 2005 සැප්තැම්බර් මස 12 දතම හා අංක **M**805 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සහ **EPTP** 25හි ලොට් 679, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : **EPTP** 25හි ලොට් 661, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක **M**805 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව **LDO/N** 06/115 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

01-151

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ආර්. එම්. ඒ. එස්. ආර්. කේ. රත්නායක.
ගිණුම් අංක : 1063 5494 6874.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි අසූ පන් ලක්ෂ තුන් දහස් දෙසිය පනස් හතයි ශත දහ හතරක (රු. 18,503,257.14) මුදලද, 2020 අගෝස්තු මස 28 වැනි දින සිට අංක 3741 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි හැට තුන් ලක්ෂ තිස් දහසක (රු. 16,330,000/-) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළියද දූන්විම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.29 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.10.19 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2022.02.21 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දූනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කුමාරගේවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තලංගම ග්‍රාමයේ පිහිටි ලේක් පාර වරිපනම් අංක 43/1 දරන ''දෙල්ගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. ඩී. කේ. ආර්. පී. පතේගම යන අය විසින් සාදන ලද 2017 සැප්තැම්බර් මස 28 දාතම හා අංක 6600 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1**A** වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඩයිනග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ අංක 1278 දරන පිඹුරේ ලොට් 02 නැගෙනහිරට : අංක 1278 දරණ පිඹුරේ ලොට් 02 සහ පුද්ගලික පාර දකුණට : පුද්ගලික පාර, අංක 1278 දරන පිඹුරේ ලොට් 09 සහ එෆ් ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන දේපල බස්නාහිරට : එෆ් ප්‍රනාන්දු සහ ඩයිනග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම බිංදුවයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 35.00) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 6600 දරණ එකී පිඹුරට අනුවය.

එකී ලොට් 1**A** පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කුමාරගේවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තලංගම ග්‍රාමයේ පිහිටි ලේක් පාර වරිපනම් අංක 43/1 දරන ''දෙල්ගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ හෙට්ටිගේ යන අය විසින් සාදන ලද 1991 අගෝස්තු මස 20 දාතම හා අංක 1278 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එච්. ජී. පීරිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : මෙහි ලොට් 2 සහ 8 දකුණට : ලොට් 8 සහ (අඩි 20 පළල පාර) බස්නාහිරට : ලොට් 9 සහ ෆැන්සිනා ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම බිංදුවයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 35.00) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 1278 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව **B**1093/63 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 1278 දරන එකී පිඹුරේ ලොට් 8 සහ 9 වශයෙන් ලකුණුකොට ඇති පාර සඳහා වෙන්කිරීම දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්

01-152

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. එම්. පී. ද සිල්වා ඇන්ඩ් සන්ස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0198 1000 1340.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.12.16 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් දෙකෝටි විසිහතරදාස් පන් ලක්ෂ හැත්තෑ පන් දහස් දෙසිය අනූවයි ශත පනස් නමයක (රු.324,575,290.59) මුදලද, 2020 දෙසැම්බර් මස 08 වැනි දින සිට අංක 52, 54, 3125 සහ 3610 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි පන් කෝටි පනස් ලක්ෂයක (රු. 255,000,000) මුදලක් සඳහා වාර්ෂිකව Average Weighted Prime Lending Rate + Four Decimal Five per centum (4.5%) බැගින් වූ පොළිය ද හා තවත් රුපියල් දෙකෝටි පනස් එක් ලක්ෂ පහළොස් දහසක (රු. 25,115,000) මුදලක් සඳහා වාර්ෂිකව Average Weighted Prime Lending Rate + Two Decimal Five per centum (2.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.01.08 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.12.28 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි උපලේඛන 01 හි සඳහන් දේපළ හා පරිශ්‍රයන්ට අදළ වෙන්දේසි කටයුතු 2022.02.17 වැනි දින ප. ව. 2.30 ට පිහිටි ස්ථානයේ දී හා උපලේඛන 02 හි සඳහන් දේපළ හා පරිශ්‍රයන්ට අදළ වෙන්දේසි කටයුතු 2022.02.17 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, හේකිත්ත අංක 5 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල - මාබෝලේ නගර සභා සීමාවන් තුළ වත්තල පිහිටි ඇවරිවත්ත පාර, වරිපනම් අංක 9/1, 9/5, 9/6 සහ 9/7 දරන " කිතුල්ගහවත්ත සහ ගොඩලියද්ද, නොහොත් "සුදුවී කුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. වී. විජයරත්න යන අය විසින් සාදන ලද 2016 ජනවාරි මස 24 දාතම හා අංක 1861 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ස්ටීවන් සිල්වා සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම සහ ඩබ්ලිව්. සී. එම්. ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : පස් කානුව සහ ඇලෝසියස් ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම, ඇවරිවත්ත පාර, වරිපනම් අංක 27 දරන පරිශ්‍රයන්, දකුණට : ඇලෝසියස් ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම සහ ඇවරිවත්ත පාර, බස්නාහිරට : පස් කානුව සහ දර්ශන ද සිල්වා විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම බිංදුවයි පහක් (A: 0. R : 1, P : 4.05) විශාල ඉඩම් කොටස අංක 1861 දරන එකී පිඹුරට අනුවය.

එකී ඉඩම පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී වත්තල පිහිටි ඇවරිවත්ත පාර, වරිපනම් අංක 9/1, 9/5, 9/6 සහ 9/7 දරන "කිතුල්ගහවත්ත සහ ගොඩලියද්ද" නොහොත් "සුදුවී කුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩී. එන්. ටී. පෙරේරා යන අය විසින් සාදන ලද 2002 මැයි මස 25 දාතම හා අංක 1458 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ස්ටීවන් සිල්වා සහ වෙනත් අය සහ ඩබ්ලිව්. සී. එම්. ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : ඇවරිවත්ත පාර, වරිපනම් අංක 27 දරන පරිශ්‍රයන් සහ ඇලෝසියස් ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම, දකුණට : ඇලෝසියස් ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම සහ ඇවරිවත්ත පාර, බස්නාහිරට : ස්ටීවන් සිල්වා සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම සහ ලොට් A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම බිංදුවයි පහක් (A: 0. R : 1, P : 4.05) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 1458 දරන එකී පිඹුරට අනුව හිමිකම් L 260/18 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 52 මගින් හා ඒ යටතේ උකස් කොට ඇපකොට ඇත.)

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, වාරියපොල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ බමුණාකොටුව ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ, හේනේගෙදර අංක 1225 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, කොළමුණේ සහ නාගනේ, බඩලගම, මඩවලගෙදර ග්‍රාමවල පිහිටි "මායා එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. කේ. පෙරේරා යන අය විසින් සාදන ලද 2015 ඔක්තෝබර් මස 29 දාතම හා අංක 1789 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්ටේට් පාර, නැගෙනහිරට : බමුණාකෙටුව සිට කළුගමුව දක්වා ප්‍රධාන පාර, දකුණට : ග්‍රාමවාසීන්ට වෙන්කළ මායා එස්ටේට් හි කොටසක්, බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර ගේ පිඹුරු අංක 154/93හි ලොට් 2 සහ ග්‍රාමවාසීන්ට වෙන්කල සහ හිමිකම් කියන මායා එස්ටේට්හි කොටසක් සහ බස්නාහිරට : ග්‍රාම වාසීන්ට වෙන්කළ මායා එස්ටේට්හි කොටසක් සහ මහාරාජා විසින් හිමිකම් කියන මායා එස්ටේට්හි කොටසක් යන මායිම් තුළ පිහිටි

ප්‍රමාණයෙන් අක්කර අටයි පර්චස් විසිපහයි දශම හයක් (A: 8. R : 0, P : 25.6) විශාල ඉඩම් කොටස අංක 1789 දරන එකී පිඹුරට අනුවය.

එකී ඉඩම පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී මඩවලගෙදර ග්‍රාමයේ පිහිටි "මායා එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර යන අය විසින් සාදන ලද 1993 සැප්තැම්බර් මස 17 දතම හා අංක 154/93 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්ටේට් පාර, නැගෙනහිරට : බමුණාකොටුව සිට කළුගමුව දක්වා ප්‍රධාන පාර, දකුණට : ග්‍රාමවාසීන්ට වෙන්කළ මායා එස්ටේට් හි කොටසක්, පිඹුරු අංක 154/93හි ලොට් 2 සහ ග්‍රාමවාසීන්ට වෙන්කළ මායා එස්ටේට්හි කොටසක් සහ බස්නාහිරට : මායා එස්ටේට්හි ලොට් A සහ B යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර අටයි රූඩ් එකයි පර්චස් පහක් (A: 8. R : 1, P : 05) විශාල ඉඩම් කොටස අංක 154/93 දරන එකී පිඹුරට අනුව හිමිකම් Q 23/114 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 54, 3125 සහ 3610 මගින් හා ඒ යටතේ උකස් කොට ඇපකොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01 -153

---

### පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2022 ක්වූ පෙබරවාරි මස 08 වැනි දින පෙ.ව. 10.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ E 451 ඉනාමළුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉනාමළුව පිහිටි ''ගලකොටුව මූකලාන ගලකොටුව හේන'' නමැති ඉඩමට සර්වේයර් වෙනුවෙන් එච්. ඩී. එන්. කල්දේරා ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2015.05.14 දිනැතිව සහතික කරනු ලැබූ කැඩැස්තර සිතියම් අංක 310016 හි නිරූපිත අංක 92
විශාලත්වය (අ. 0, රූ. 2 පර්. 5.8)

2. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඊ 451 ඉනාමළුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉනාමළුව ''ගලකොටුව මූකලාන ගලකොටුව හේන'' නමැති ඉඩමට සර්වේයර් වෙනුවෙන් එච්. ඩී. එන්. කල්දේරා ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2015.05.14 දිනැතිව සහතික කරනු ලැබූ කැඩැස්තර සිතියම් අංක 310016 හි නිරූපිත අංක 96
විශාලත්වය (අ. 0, රූ. 1 පර්. 34.1)

ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට අංක 00390001119 මාතලේ සහ 00390001024 මාතලේ දරන හිමිකම් සහතිකයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම ඔරන්මා (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදයී ලෙස ද සහ කුරුකුල ජයසූරියලාගේ හසන්ත උදාර ප්‍රේම් පෙරේරා ජයසූරිය (බන්ධනදයී සමාගමේ අධ්‍යක්ෂක) යන අය 'උකස්කරු' ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2021.05.07 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රයද* , වර්ෂ 2021.05.06 දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - දඹුල්ල නගර මධ්‍යයේ සිට ත්‍රිකුණාමලය පාර දෙසට කිලෝමීටර් 8ක් පමණ ඉනාමළුව හන්දිය දක්වා ගමන් කර 99/2 බෝක්කුව අසළින් දකුණට හැරී සීගිරිය පාර දෙසට කිලෝමීටර් 2.1ක් ගමන් කරන විට 3/2 බෝක්කුව හමුවේ. ඊට වම් පසින් දේපළ පිහිටා ඇත.
(2km කණුව පසුකර මීටර් 100ක් පමණ දුරින් පිහිටා ඇත)

*ගෙවීමේ ක්‍රමය :* වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද, (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500.00ද,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමනාකරු, ණය අයකර ගැනීම් පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 - 4667227/011-4667220.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 071 8446374, 077 7761706
ෆැක්ස් : 081 12210595

01-154

---

## සෙලාන් බැංකුව - පීඑල්සී - ජාඇල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ කඳාන ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව්/යූ/1008 දරන සමීර කේටර්ස් යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කඳාන පදිංචි අතාවුද ආරච්චිලාගේ සරත් ප්‍රේමවංශ යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සහ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල නගර සභා සීමාව තුළ ජාඇල ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ අංක 190 සී, කපුවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ වැලිගම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ජයන්ත පෙරේරා විසින් සාදන ලද 2013.09.07 දිනැති අංක 3038 සැලැස්මේ නිරූපණය වන බටගම පාර, වරිපනම් අංක 45/43 දරන මිල්ලගහකුරුඳුවත්ත නමැති ඉඩමේ ලොට් සී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහතුනයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.50) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද අංක 11279 සැලැස්මේ නිරූපණය වන ලොට් බී (අඩි 20 ක් පළල පාර) ලොට් 11 ඊ සහ ලොට් 13 ඒ (අඩි 20 ක් පළල පාරට) යන මාර්ග අයිතිය සමග වේ.

ඉහත සඳහන් දේපළ 2022 පෙබරවාරි මස 09 වැනි දින පෙරවරු 10.00 ට සෙලාන් බැංකුව පීඑල්සී ජාඇල ශාඛා පරිශ්‍රයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

